119937

OL/2024(2025)/62/S-I, II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**62 | S | I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)**
**General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)**

| | |
|---|---|
| **පුරවැසි අධ්‍යාපනය** | **I, II** |
| குடியியற் கல்வி | **I, II** |
| Civic Education | **I, II** |

*පැය තුනයි*
*மூன்று மணித்தியாலம்*
*Three hours*

| | |
|---|---|
| **අමතර කියවීම් කාලය** | - **මිනිත්තු 10 යි** |
| மேலதிக வாசிப்பு நேரம் | - 10 நிமிடங்கள் |
| Additional Reading Time | - 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## පුරවැසි අධ්‍යාපනය I

**උපදෙස්:**

- ✻ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ✻ අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
- ✻ **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**
- ✻ එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අනුව මින් කුමන වයස් කාණ්ඩයට අයත් පුද්ගලයන් ළමයකු ලෙස හඳුන්වා දිය හැකි ද?
(1) වයස අවුරුදු 21 ට අඩු (2) වයස අවුරුදු 19 ට අඩු
(3) වයස අවුරුදු 18 ට අඩු (4) වයස අවුරුදු 16 ට අඩු

**2.** පුද්ගල මනස තුළ ඇතිවන පහත සඳහන් කුමන තත්ත්වයක් ගැටුමක මූලාරම්භයට හේතු වේ ද?
(1) පුද්ගල විවිධත්වය (2) නොඉවසිලිමත්කාරී බව
(3) ක්ෂණික කෝපය (4) මානසික ආතතිය

**3.** ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථකථනය කිරීමේ අධිකරණ බලය සහිත ආයතනය වන්නේ,
(1) මහාධිකරණයයි. (2) ශ්‍රේෂ්ඨාධිකරණයයි.
(3) දිසා අධිකරණයයි. (4) අභියාචනාධිකරණයයි.

**4.** මධ්‍ය සැලසුම් මණ්ඩලයක් මගින් ආර්ථිකය මෙහෙයවීම දක්නට ලැබෙන්නේ කුමන අර්ථ ක්‍රමයක ද?
(1) සමාජවාදී (2) ධනවාදී (3) ලිබරල්වාදී (4) පැසිස්ට්වාදී

**5.** මැතිවරණයකින් තේරී පත්වන පාර්ලිමේන්තුවේ පළමු කාර්යය වන්නේ මින් කුමක් ද?
(1) පාර්ලිමේන්තුව පාලනයට අවශ්‍ය නීති සම්පාදනය කිරීම
(2) පාර්ලිමේන්තුව සඳහා කථානායකවරයකු පත් කර ගැනීම
(3) පාර්ලිමේන්තු කාරක සභා නියෝජිතයන් පත් කර ගැනීම
(4) පාර්ලිමේන්තුවට විපක්ෂ නායකවරයකු පත් කර ගැනීම

**6.** පාරිසරික ගැටලු ඇති වීමට බලපාන ස්වභාවික හේතුවක් වන්නේ මින් කුමක් ද?
(1) ජල ගැලීම් (2) නිවාස ඉදිකිරීම්
(3) මැණික් ගැරීම් (4) ජලාශ ඉදිකිරීම්

**7.** ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක 'පරමාධිපත්‍ය බලය' යනුවෙන් හඳුන්වන්නේ පාලන කටයුතු පවත්වා ගෙන යාමට
(1) ජනතාව සතු බලයයි. (2) විධායකය සතු බලයයි.
(3) පාර්ලිමේන්තුව සතු බලයයි. (4) ඇමති මණ්ඩලය සතු බලයයි.

[දෙවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**8.** 2024 වර්ෂයේදී පවත්වන ලද මහ මැතිවරණයෙන් මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගන්නා ලද්දේ ශ්‍රී ලංකාවේ කීවෙනි පාර්ලිමේන්තුවට ද?
(1) අටවන පාර්ලිමේන්තුවටය (2) නවවන පාර්ලිමේන්තුවටය
(3) දහවන පාර්ලිමේන්තුවටය (4) එකොළොස්වන පාර්ලිමේන්තුවටය

**9.** ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් යටතට අයත්වන අයිතියක් වන්නේ කුමක් ද?
(1) නිදහස් මත ප්‍රකාශ කිරීමට ඇති අයිතිය (2) ගමනාගමනයට ඇති අයිතිය
(3) සාධාරණ නඩු විභාගයකට ඇති අයිතිය (4) සමාජ ආරක්ෂණයට ඇති අයිතිය

**10.** ගැටුම් නිරාකරණයේදී අනුගමනය කරන 'විනිසීමේ' ක්‍රියාවලියක ලක්ෂණයක් නම්
(1) සාකච්ඡාවෙන් දෙපාර්ශ්වයටම ඉවත් විය නොහැකි වීමයි.
(2) විත්තිකරුවන් අධිකරණයෙහි පෙනී නොසිටිය යුතු වීමයි.
(3) පැමිණිලි පාර්ශ්වයට හරස් ප්‍රශ්න ඇසිය නොහැකි වීමයි.
(4) අභියාචනා ඉදිරිපත් කිරීමට අවස්ථාවක් නොමැති වීමයි.

**11.** කලාපීය සංවිධාන ආරම්භ කිරීමේ එක් ප්‍රධාන අරමුණක් වන්නේ,
(1) විදේශ ණය ලබා ගැනීම ප්‍රවර්ධනය කිරීමයි. (2) ආර්ථික සහයෝගීතාව ඇති කර ගැනීමයි.
(3) තාක්ෂණික අත්දැකීම් හුවමාරු කර ගැනීමයි. (4) ආපදා කළමනාකරණයට උදව් ලබා ගැනීමයි.

**12.** නව ලිබරල්වාදී වෙළඳපොළ ආර්ථිකයක මූලික ලක්ෂණයක් වන්නේ,
(1) රට තුළ දැඩි විනිමය පාලනයක් සිදු කිරීමයි.
(2) ජනතාවට ලබා දෙන සහනාධාර කපා හැරීමයි.
(3) ආර්ථික කටයුතුවලට රාජ්‍ය අංශය මැදිහත් වීමයි.
(4) රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණය කිරීමයි.

**13.** ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීමට හේතු වූ භූගෝලීය සාධකයක් වන්නේ,
(1) ත්‍රිකුණාමලයේ ස්වභාවික වරායක් පිහිටා තිබීමයි.
(2) ස්වභාවික සම්පත් විශාල ප්‍රමාණයක් පිහිටා තිබීමයි.
(3) කොළඹ වරායක් පිහිටා තිබීමයි.
(4) ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටා තිබීමයි.

**14.** 1977–1993 කාලසීමාව තුළදී ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ආර්ථිකයට හඳුන්වා දුන් ප්‍රතිපත්තියක් වන්නේ,
(1) සලාක ක්‍රම ප්‍රතිපත්තියයි. (2) දේශීය කර්මාන්ත ප්‍රතිපත්තියයි.
(3) විවෘත ආර්ථික ප්‍රතිපත්තියයි. (4) ආනයන සීමා ප්‍රතිපත්තියයි.

**15.** අභ්‍යන්තර ගැටුම් පිළිබඳව වඩාත් අර්ථාන්විත අදහස කුමක් ද?
(1) රටක ජීවත්වන ජනතාව තුළ දැකිය හැකි පුද්ගල හා සමාජීය ගැටුම් ය.
(2) යම්කිසි ප්‍රදේශයක ජීවත්වන ජනතාව අතර ඇතිවන සමාජීය ගැටුම් ය.
(3) පවුලක සිටින සාමාජිකයන් අතර දේපල සම්බන්ධව ඇතිවන ගැටුම් ය.
(4) ජන කණ්ඩායම් දෙකක් අතර වාර්ගිකත්වය මත ඇතිවන ගැටුම් ය.

**16.** මධ්‍යම ආණ්ඩුව සතු බලතල ප්‍රාදේශීය පාලන ඒකක වෙත පාර්ලිමේන්තු පනතක් මගින් පැවරීම
(1) බලය බෙදා හැරීම ලෙස සැලකේ. (2) බලය විමධ්‍යගත කිරීම ලෙස සැලකේ.
(3) බලය පවරා දීම ලෙස සැලකේ. (4) බලය කේන්ද්‍රගත කිරීම ලෙස සැලකේ.

**17.** පරිසරයට සිදුවන හානි කෙරෙහි බලපාන මූලික හේතුවක් වන්නේ,
(1) ජනතාව විසින් අනුගමනය කරන වැරදි ජීවන රටාවන් ය.
(2) රජය විසින් පරිසරයට අදාළ නීති ක්‍රියාත්මක නොකිරීම ය.
(3) ජාත්‍යන්තර වශයෙන් සිදු කරනු ලබන විවිධ බලපෑම් ය.
(4) දේශපාලන අස්ථාවරත්වයක් ආණ්ඩුව තුළ පැවතීම ය.

**18.** සංවර්ධනය මැනීම සඳහා නූතනයේදී භාවිතයට ගන්නා මිනුමක් වන්නේ,
(1) දළ ජාතික දර්ශකයයි. (2) ආර්ථික වර්ධන දර්ශකයයි.
(3) මානව සංවර්ධන දර්ශකයයි. (4) පුද්ගල සාක්ෂරතා දර්ශකයයි.

**19.** වර්තමානයේ දී ඍජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන ගැටලුවක් වන්නේ,
(1) රාජ්‍යයන්වල ජනගහනය අධික වීමයි. (2) මැතිවරණ වියදම් සීමා කිරීමයි.
(3) මහජනතාව ඡන්දය භාවිත නොකිරීමයි. (4) විරුද්ධ පක්ෂ ක්‍රියාකාරීත්වය දුර්වල වීමයි.

[තුන්වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**20.** ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණයක් වන්නේ,
(1) වෘත්තිය පුහුණුව ලබා ගැනීමට අවස්ථා තිබීමයි.
(2) මහජන විරෝධතා පැවැත්වීමට හැකියාව තිබීමයි.
(3) නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීමයි.
(4) විරුද්ධ පක්ෂ සඳහා නායකයකු පත් කර ගැනීමයි.

**21.** පරිසරය සම්බන්ධ පුරවැසි යුතුකමක් වන්නේ,
(1) ව්‍යාපෘතිවලදී පරිසර පිරිවැය තක්සේරු කිරීමයි.
(2) පරිසර හිතකාමී ජීවන ක්‍රමයක් අනුගමනය කිරීමයි.
(3) ජාතික පරිසර පනත නිවැරදිව අනුගමනය කිරීමයි.
(4) සමාජය තුළ පරිසර හිතකාමී පුරවැසියන් බිහි කිරීමයි.

**22.** ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවලට පැවරී ඇති කාර්යයන් අතුරෙන් පොදු උපයෝගිතා සේවාවක් නම්,
(1) මහජන සෞඛ්‍ය වැඩිදියුණු කිරීමයි. (2) මාර්ග නඩත්තුව හා ආරක්ෂා කිරීමයි.
(3) මහජන වැසිකිළි නඩත්තු කිරීමයි. (4) පොදු කියවීම් ශාලා පවත්වාගෙන යාමයි.

**23.** 'සමථකරණය' මාර්ගයෙන් ගැටුම් නිරාකරණය කර ගැනීමේ වාසියක් වන්නේ මින් කුමක් ද?
(1) නඩු මාර්ගයට නොගොස් ගැටුම් විසඳාගත හැකි වීම
(2) ප්‍රතිවිරුද්ධ පාර්ශ්වයන් අතර සංවාදයක් ඇති වීම
(3) නම්‍යශීලී කණ්ඩායම් ක්‍රියාවලියක් සඳහා යොමු වීම
(4) අදාළ පාර්ශ්ව සමග සහයෝගීතාව නිර්මාණය වීම

**24.** අන්තර්ජාතික ගැටුම්වල අවසාන ප්‍රතිඵලය වන්නේ,
(1) ජාතීන් අතර අසමගිය ඇති වීමයි. (2) ප්‍රබල ජාතීන් පෙරමුණ ගැනීමයි.
(3) යුධමය වාතාවරණයක් ඇති වීමයි. (4) ලෝක බල කඳවුරු නිර්මාණය වීමයි.

**25.** නීතියේ ආධිපත්‍ය තහවුරු වී තිබෙන සමාජයක දැකිය හැකි ලක්ෂණය කුමක් ද?
(1) විනිශ්චයකාරවරුන්ට තීන්දු ගැනීමේදී බලපෑම් සිදුවීම
(2) නීතිය පිළිබඳව පුරවැසියන්ට අනවබෝධයක් තිබීම
(3) නීතිය නොදැන සිටීම නිදහසට කාරණයක් වීම
(4) නීතිය ඉදිරියේ සැමදෙනාටම සමානව සැලකීම

**26.** ආර්ථික සංවර්ධනය මන්දගාමී වී, සමාජ සාධාරණත්වය බිඳ වැටීම නිසා වර්තමානයේදී ඇති වූ සංකල්පයක් වන්නේ,
(1) ආණ්ඩු පාලනයයි. (2) යහපාලනයයි. (3) රාජ්‍ය පාලනයයි. (4) ආර්ථික පාලනයයි.

**27.** රාජ්‍ය උපාය සම්බන්ධතා ශක්තිමත් කර ගැනීමේ මාර්ගයක් වන්නේ,
(1) ජාත්‍යන්තර සමුළුවලට සහභාගී වීමයි. (2) හමුදා සොල්දාදුවන්ට පුහුණුව ලබා දීමයි.
(3) ගැටුම්වලදී මානුෂීය ආධාර ලබාදීමයි. (4) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණය ලබා දීමයි.

**28.** මිනිස් සමාජය තුළ මානව අයිතිවාසිකම් දිනා ගනු ලැබීමට හේතුවක් වූයේ මින් කුමක් ද?
(1) ආගමික නායකත්වයේ මග පෙන්වීම (2) පුරවැසියන්ගේ සමාජ ජීවිතයේ දියුණුව ඇති වීම
(3) පාලකයන්ට එරෙහිව සටන් කිරීම (4) ජාතීන් අතර සහයෝගය වර්ධනය වීම

**29.** සන්ධීය රාජ්‍යයක සාර්ථක පැවැත්ම සඳහා තිබිය යුතු ගුණාංගයක් වන්නේ කුමක් ද?
(1) ඉහළ මන්ත්‍රණ සභාවක් මගින් පාලන කටයුතු සිදු කිරීම
(2) රාජ්‍යයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු කිරීම
(3) ආර්ථික තීන්දු ගැනීමේ ක්‍රියාවලිය මධ්‍යම ආණ්ඩුවට පැවරීම
(4) ලිඛිත කොන්දේසි අනුව ප්‍රාදේශීය ආණ්ඩු පාලනය කිරීම

**30.** 2004 වර්ෂයේදී ශ්‍රී ලංකාවට බලපෑ ප්‍රබල ස්වභාවික ආපදාව කුමක් ද?
(1) සුළි කුණාටුව (2) දැඩි නියගය (3) සුනාමිය (4) භූමිකම්පාව

**31.** 'ප්‍රජාතන්ත්‍රවාදය' පාලන ක්‍රමයක් ලෙස වැදගත් වන්නේ මින් කුමක් නිසා ද?
(1) විධායකයේ කටයුතු ව්‍යවස්ථාදායකය විසින් පාලනය කිරීම නිසා ය.
(2) මහජනතාවට සමාන අයිතිවාසිකම් භුක්ති විඳීමට හැකි වීම නිසා ය.
(3) සෑම පක්ෂයකම අදහස් නියෝජනය කිරීමට අවස්ථාව ලැබීම නිසා ය.
(4) පාලනයට නියෝජිතයන් මහජන කැමැත්තෙන් තෝරා ගැනීම නිසා ය.

[හතරවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**32.** ආදිවාසි ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ඇති කරගන්නා ලද සම්මුතියට අනුව,
(1) ඔවුන්ගේ රැකියාව, භාෂාව, සිරිත් විරිත් හා ඇදහිලි ක්‍රම එලෙසින්ම පවත්වා ගෙන යා හැකි ය.
(2) ආදිවාසීන්ගේ දරුවන්ට නව රැකියා සඳහා අවශ්‍ය වන්නා වූ පුහුණුවක් ලබාගත හැකි ය.
(3) සාමාන්‍ය ජනතාවගේ පොදු සංස්කෘතික අංගවලට අනුගතව, ඒවා අනුගමනය කළ හැකි ය.
(4) තමාගේ දෛනික අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා ස්වයං රැකියාවක නිරත විය හැකි ය.

**33.** ජාත්‍යන්තර වශයෙන් මූල්‍ය පිළිබඳ ස්ථාවරත්වයක් හා විධිමත් විනිමය ක්‍රමයක් පවත්වාගෙන යාමේ අරමුණෙන් ආරම්භ කරන ලද ජාත්‍යන්තර සංවිධානය කුමක් ද?
(1) ලෝක බැංකුව
(2) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල
(3) ආසියානු සංවර්ධන බැංකුව
(4) යුරෝපා සංගමය

**34.** සමාජයක පවතින දැනුම, ඇදහිලි, කලා, නීතිරීති, සිරිත් විරිත් හා අගයයන් සියල්ලේ එකතුව හඳුන්වනු ලබන්නේ,
(1) පරම්පරාව ලෙසයි.
(2) සමාජය ලෙසයි.
(3) සංස්කෘතිය ලෙසයි.
(4) සම්ප්‍රදාය ලෙසයි.

**35.** අප්‍රමාදව හා අපක්ෂපාතීව යුක්තිය පසිඳලීම ප්‍රමාද වීම නිසා ඇති විය හැකි **අවාසියක්** වන්නේ,
(1) අපරාධ හා දූෂණ පහළ යාමයි.
(2) නීතිය වෙනුවට අවනීතිය ඉදිරියට ඒමයි.
(3) නීතියේ සාධාරණත්වය ඉහළ යාමයි.
(4) නීතිය කෙරෙහි ඇති ගෞරවය වැඩි වීමයි.

**36.** ශ්‍රී ලංකාවේ පාලන කටයුතු සඳහා ද්විමණ්ඩල ව්‍යවස්ථාදායක ක්‍රමයක් හඳුන්වා දෙන ලද්දේ කුමන ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මගින් ද?
(1) මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය
(2) මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය
(3) ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය
(4) සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

**37.** රටක තිරසර සංවර්ධනය ළඟා කර ගැනීමේදී ජය ගත යුතු අභියෝගයක් වන්නේ මින් කුමක් ද?
(1) භෞතික සංවර්ධන ක්‍රියාවලිය වේගවත් කිරීම
(2) වෙළඳපොළ තුළ තරගයක් නිර්මාණය කිරීම
(3) සමාජ සුබසාධන කටයුතු වර්ධනය කිරීම
(4) පරිසර හිතකාමී සම්පත් පරිහරණය කිරීම

**38.** භෞතික පරිසරයට හානි සිදුවන ස්වභාවික සංසිද්ධීන් අඩංගු වරණය කුමක් ද?
(1) කාන්තාරීකරණය හා අම්ල වැසි
(2) භූමිකම්පා හා සුළිකුණාටු
(3) ජල දූෂණය හා වායු දූෂණය
(4) හිම දියවීම හා ගෝලීය උණුසුම

**39.** පහත 'අ' තීරුවේ අධිකරණය මගින් විසඳීමට යොමු කරන විවිධ නඩු වර්ග හා 'ආ' තීරුවෙන් ඒ සඳහා ක්‍රියාත්මක වන අධිකරණ ආයතන දැක්වේ.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. මහජන ආරක්ෂාව සම්බන්ධ වැරදි | A - මහාධිකරණය |
| 2. බාලවයස්කරුවන්ගේ භාරකාරත්වය පිළිබඳ නඩු | B - පළාත්බද මහාධිකරණය |
| 3. රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණ පිළිබඳ නඩු | C - දිසා අධිකරණය |
| 4. වාණිජ ආරවුල් විසඳීම | D - අභියාචනාධිකරණය |
| 5. මැතිවරණ පෙත්සම් විභාග කිරීම | E - මහේස්ත්‍රාත් අධිකරණය |
| | F - ශ්‍රේෂ්ඨාධිකරණය |

'අ' තීරුවට අනුව 'ආ' තීරුව පිළිවෙළින් ගැළපූ විට ලැබෙන පිළිතුර කුමක් ද?
(1) ABCDF (2) CBADE (3) DABEF (4) ECABD

**40.** පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක හා ජනාධිපති ආණ්ඩුක්‍රමයක මූලික ලක්ෂණ කිහිපයක් පහත දක්වා ඇත.
A - විධායකය ව්‍යවස්ථාදායකයට වගකීමට බැඳී නොමැත.
B - ව්‍යවස්ථාදායකය තුළින් විධායකය තෝරා පත් කර ගනියි.
C - ව්‍යවස්ථාදායකය හා විධායකය අතර ඍජු බැඳීමක් නැත.
D - විධායකය ඉවත් කිරීමට ව්‍යවස්ථාදායකයට හැකියාව ඇත.
E - විධායකය සිය කටයුතු සම්බන්ධව සාමූහික වගකීමට බැඳී සිටියි.

ඉහත සඳහන් ලක්ෂණ අතුරෙන් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක ලක්ෂණ **පමණක්** දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) ABC (2) BCD (3) BDE (4) CDE

* *



Department of Examinations Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

62 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)

පුරවැසි අධ්‍යාපනය I, II
குடியியற் கல்வி I, II
Civic Education I, II

## පුරවැසි අධ්‍යාපනය II

※ **පළමුවන** ප්‍රශ්නය අනිවාර්ය වේ.

※ **පළමුවන** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** (i) පුරවැසියකු විසින් සමාජය වෙත ඉටු කළ යුතු නීතිමය යුතුකම් **දෙකක්** සඳහන් කරන්න.

(ii) ඇමරිකා එක්සත් ජනපදයේ සන්ධීය ව්‍යවස්ථාවට අනුව මධ්‍යම ආණ්ඩුව සතු බලතල **දෙකක්** ලියන්න.

(iii) මහ නගර සභාවලට පැවරී ඇති බලතල **දෙකක්** ලියන්න.

(iv) ආර්ථික උපකාරක සේවා යටතට අයත්වන ප්‍රධාන කොටස් **දෙක** මොනවා ද?

(v) ගැටුම් ඇතිවන පාර්ශ්ව **දෙකක්** සඳහන් කරන්න.

(vi) ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාවට ඇති වී තිබෙන ධනාත්මක බලපෑම් **දෙකක්** ලියන්න.

(vii) අතීතයේදී ශ්‍රී ලංකාවේ වෙළඳාම සඳහා පැමිණි යුරෝපීය ජාතීන් **දෙකක්** සඳහන් කරන්න.

(viii) දේශීය නීතියට අයත්වන කොටස් **දෙකක්** නම් කරන්න.

(ix) පවුලේ සාමාජිකයකු ලෙස ඔබට භුක්ති විඳීමට ලැබෙන අයිතිවාසිකම් **දෙකක්** සඳහන් කරන්න.

(x) සාර්ක් සංවිධානයට අයත් සාමාජික රටවල් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 × 10 = 20 යි)

**2.** ගෝලීයකරණ ක්‍රියාවලියත් සමග ලෝකයේ බොහෝ රටවල් බහු සංස්කෘතික ජන සමාජයන් බවට පරිවර්තනය වෙමින් පැවතීම ප්‍රධාන ප්‍රවනතාවක් වේ.

(i) ශ්‍රී ලංකාවේ ජීවත්වන ප්‍රධාන ජනවර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) බහුසංස්කෘතික සමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියන් විසින් අනුගමනය කළ යුතු සමාජ හා සංස්කෘතික සාධක **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) ශ්‍රී ලංකාවේ බහු සංස්කෘතික සමාජය තුළ විවිධ ජන වර්ග අතර විශ්වාසය ඇති කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(*b*) ඉහත (*a*) හි සඳහන් කරන ලද ක්‍රියාමාර්ග අනුගමනය කිරීමෙන් බහු සංස්කෘතික ජන සමාජයකට අත්පත් කරගත හැකි වාසි **දෙකක්** නම් කර, ඉන් **එකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03 යි)

**3.** වර්තමානයේදී පරිසරය පිළිබඳව දැඩි අවධානයට යොමු වී ඇත්තේ පරිසරය විවිධ විපර්යාසවලට ගොදුරු වීම නිසා මිනිස් ජීවිතවලට එහි බලපෑම් ඇති වන බැවිනි.

(i) පාරිසරික ගැටලු ඇතිවීමට බලපාන සාධක **දෙක** මොනවා ද? (ලකුණු 02 යි)

(ii) පරිසරය සම්බන්ධව පුරවැසියන් සතු වගකීම් **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) දේශගුණික වෙනස්වීම් නිසා පරිසරයට ඇති විය හැකි අහිතකර ප්‍රතිඵල **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(*b*) ඉහත (*a*) හි සඳහන් අහිතකර ප්‍රතිඵල අවම කරගැනීම සඳහා පුරවැසියකුට ගත හැකි ක්‍රියාමාර්ග **දෙකක්** නම් කර, ඉන් **එකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

[හයවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**4.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව මධ්‍යම ආණ්ඩුව හා පළාත් පාලන ආයතන අතර බලය බෙදාගෙන පාලනය කිරීම වර්තමානයේ දක්නට ලැබෙන ලක්ෂණයකි.

(i) රාජ්‍යයන්ගේ ප්‍රධාන ස්වරූප **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ව්‍යවස්ථාදායක මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන් **තුන** මොනවා ද? (ලකුණු 03 යි)

(iii) (*a*) ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියකු සතු විය යුතු වැදගත් ගුණාංග **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(*b*) ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක සාර්ථකත්වයට නිදහස් හා අපක්ෂපාතී ජනමාධ්‍යයකින් ඉටුවිය යුතු සේවාවන් **දෙකක්** සඳහන් කර, ඉන් **එකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

**5.** පුද්ගලයන් තුළ පවතින අරමුණු, අභිලාෂයන් හා අවශ්‍යතාවන් හේතු කොටගෙන ඔවුන් අතර ගැටුම් නිර්මාණය වේ.

(i) අන්තර්ජාතික ගැටුම් වර්ග කළ හැකි ආකාර **දෙක** ලියන්න. (ලකුණු 02 යි)

(ii) යම් පුද්ගලයකු තුළ හෝ පුද්ගලයන් අතර ගැටුමක් නිර්මාණය වීමට බලපාන හේතු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) ගැටුම් නිරාකරණය කිරීම සඳහා 'මැදිහත්කරණය' යොදා ගතහැකි අවස්ථා **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(*b*) ගැටුම් නිරාකරණයේදී පාසල් ශිෂ්‍යයකු විසින් පුහුණු කරගත යුතු පුද්ගල ගුණාංග **දෙකක්** සඳහන් කර, ඉන් **එකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03 යි)

**6.** මිනිස් සමාජය ක්‍රම ක්‍රමයෙන් දියුණුව කරා ගමන් කළ බැවින් පුද්ගලයන් සතු මානව හිමිකම් ලබා ගැනීම කෙරෙහි ද මිනිසාගේ දැඩි අවධානය යොමු වන්නට විය.

(i) අයිතිවාසිකම් සම්බන්ධ ක්‍රියාවලියේදී දක්නට ලැබෙන ප්‍රධාන පාර්ශ්ව **දෙක** මොනවා ද? (ලකුණු 02 යි)

(ii) ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට පදනම් කරගෙන ඇති මූලධර්ම **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ට යහපත් ජීවිතයක් ගත කිරීම සඳහා රජය මගින් සලසා ඇති විශේෂ පහසුකම් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(*b*) ඔබේ පාසලේ සිටින විශේෂ අවශ්‍යතා සහිත ශිෂ්‍යයන් සඳහා පාසල් ශිෂ්‍යයකු ලෙස ඔබට උදව් කළ හැකි ආකාර **දෙකක්** සඳහන් කර, ඉන් **එකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03 යි)

**7.** නීතියේ ප්‍රධාන පරමාර්ථය වන්නේ මහජනතාවගේ ජීවිත, අයිතිවාසිකම් හා දේපොළ ආරක්ෂා වන අයුරින් මානව හැසිරීම් පාලනය කිරීමයි.

(i) ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය තුළ ක්‍රියාත්මක වන විශේෂ නීති වර්ග **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රේෂ්ඨාධිකරණය සතු අධිකරණ බලයන් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) නීතිය ක්‍රියාවට නංවන ප්‍රධානින් **දෙදෙනෙක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(*b*) නීතිගරුක පුරවැසියකු ලෙස ජීවත්වීමෙන් ඇති විය හැකි වාසි **දෙකක්** සඳහන් කර, ඉන් **එකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

* * *

Department of Examinations Sri Lanka